ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 18th May 2021

පැමිණිලි පාර්ශවය : එස්.ජී.ඩී. කාංචන මහතා,
අංක : 167/1, කොරසගොඩ,
උඩුතුත්තිරිපිටිය.

වගඋත්තර පාර්ශවය : 1. යුධ හමුදාපති,
යුධ හමුදා මූලස්ථානය,
කොළඹ.

2. මාණ්ඩලික සැරයන් දසනායක මහතා,
1 වන ඉංජිනේරු සේවා බලකාය,
යුධ හමුදා පොලීසිය,
යුධ හමුදා ජනපදය, පනාගොඩ,
හෝමාගම.

<u>පැමිණිලි අංකය : HRC359/14</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, හමුදා සෙබලෙකු වන තමාට මාණ්ඩලික සැරයන්වරයෙකු වන දසනායක යන අය පුද්ගලික හේතුවක් මත 2013.01.28 වන දින කණට පහරදුන් බවත්, එම පහරදීම හේතුවෙන් පැමිණිලිකරු යුධ හමුදා රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවත්ය. එම පහරදීම සම්බන්ධයෙන් යුධ හමුදාවේ නිලධාරීන් වෙත දැනුම්දීම කළද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු පැමිණිල්ලෙන් ඉල්ලා සිටින සහනය වන්නේ, දෙවන වගඋත්තරකරුගේ පහරදීම නිසා තම කණෙහි ස්නායු ආබාධයටද ලක්ව ඇති බැවින්, ඒ සඳහා ශ්‍රවණ ආධාර උපකරණයක් අවශ්‍ය බව ද, ඒ සඳහා රු. 110,000/- මුදලක් අවශ්‍ය වන බව ද, එම මුදල යුධ හමුදාවෙන් ලබාතොදන බවත්, එය වගඋත්තරකරුවන්ගෙන් ලබාදෙන ලෙසත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ලට අදාලව යුධ හමුදාපතිවරයාගෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව පැමිණිලිකරු ඉංජිනේරු සේවා බලකායේ අරක්කැමියෙකු ලෙස සේවය කරන බවත්, එම ඒකකයේ සරඹ උපදේශකවරයෙකු වන සැරයන් දසනායක යන අය සැරයන්වරයාගේ තිල නිවසේදී පැමිණිලිකරුගේ කම්මුලට පහරදී ඇති බවත්, පසුව පැමිණිලිකරු පෞද්ගලික රෝහලකට ගොස් ප්‍රතිකාර ලබාගෙන ඇති අතර, කණේ රෝගී තත්ත්වය සුව නොවීම නිසා යුධ හමුදා රෝහලට ඇතුලත්වී ප්‍රතිකාර ලබාගෙන ඇති බවත්ය. ඒ අනුව කණේ පවතින රෝගය අනාගත කාර්යක්ෂමතාවයට බලපාන බව වෛද්‍යවරයාගේ නිගමනය වී ඇති බවද දක්වා ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරුව වෛද්‍ය මණ්ඩලයට යොමු කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iii) අනුව සංශෝධිත 22/93 ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කල යුතු බවට යුධ හමුදාපති නිගමනය කර ඇති බවයි.

මෙම බලයලත් II පෙළ නිලධාරියාට විරුද්ධව යුධ හමුදා පනත අනුව ලඝු නොවන තඩු විභාගයක් පවත්වා දඩුවම් දී ඇති බවද දක්වා ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2016.09.27 දින මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එහිදී යුධ හමුදාපති වෙනුවෙන් වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු මෙම පැමිණිල්ලෙන් දන්වා ඇති පරිදි මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන තෙක් යුධ හමුදාව විසින් කිසිදු පියවරක් නොගත් බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකරු මෙම සිද්ධියෙන් පසුව යුධ හමුදාව වෙත පැමිණිලි කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා 2014.02.13 වන දින අවසන් වාර්තාව ද සකස් කර තිබූ බවත්ය. මෙම සිද්ධිය සඳහා මූලික පරීක්ෂණ උසාවියක් පත්කර ඒ අනුව යුධ හමුදාපතිවරයා නිගමනය කර ඇත්තේ පැමිණිලිකරුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 ප්‍රකාරව ක්‍රියාකළ යුතු බවත්, මෙම සිද්ධියේ චූදිතයා වන බලලත් නිලධාරි II දසනායක සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු බවත්, මෙහිදී මෙම අය විසින් චෝදනා පිළිගෙන ඇති බැවින් ඔහුට තරවටු කර ඇති බවත්ය.

කොමිෂන් සභා පරීක්ෂණයේදී පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමා මේ සම්බන්ධයෙන් 2014.01.18 වන දින මුල් පැමිණිල්ල කළ බවත්, මාණ්ඩලික සැරයන් දසනායක විසින් පහරදීම නිසා තමා ශ්‍රවන ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් මෙතෙක් ප්‍රතිකාර ලබමින් සිටින බවත්ය. මේ සම්බන්ධයෙන් යුධ හමුදා පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව මාණ්ඩලික සැරයන්වරයාට යුධ හමුදාපතිගේ නියෝග වලට අනුව දඩුවම් නියම කර ඇති බවත්, මෙම පරීක්ෂණ පැවැත්වෙන අතරතුරදී තමා විසින් මාණ්ඩලික සැරයන් දසනායක යන අයගෙන් රු. 210,000/- මුදලක් ලබාගෙන ඇති බවත්, තමා

වැඩිදුරටත් ඉල්ලා සිටින්නේ, ආබාධිත තත්ත්වයට ප්‍රතිකාර ලබාගැනීම අවසන් බැවින්, ඒ සඳහා සුදුසු සහනයක් ලබාදෙන්නේ නම් එය පහසුවක් වන බවත්ය.

වගඋත්තරකාර මාණ්ඩලික සැරයන් දසනායක මහතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුට 2014.01.17 වන දින පහරදීමක් සිදුකල බවට යුධ හමුදා මූලික පරීක්ෂණයේදී පිළිගෙන ඇති බැවින් එහි ප්‍රතිපලයක් ලෙස තමාට දඬුවම් නියම කර ඇති බවයි. පැමිණිලිකරුට තමා රු. 210,000/- මුදලක් මේවනවිටත් ලබාදී ඇති බවත්, මෙම පැමිණිල්ල ඉල්ලා අස් කර ගැනීම ලිඛිතව ලබාදී ඇති බවත් සඳහන් කර ඇත.

නමුත්, පැමිණිලිකරු 2017.11.14 වන දින කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් දන්වා ඇත්තේ තමාට සහනයක් නොලැබුනු බවයි. ඒ අනුව නැවතත් 2018.02.20 වන දින නැවත පාර්ශවයන් කැඳවන ලදි. එහිදී පැමිණිලිකරුට යුධ හමුදා රෝහලට ආසන්න කඳවුරක් ලබාදීමට ඒකක විධායක අධ්‍යක්ෂක පොරොන්දු වී ඇතත් එය ඉටු කර නැති බවත්, පැමිණිලිකරුට උසස්වීම් අහිමිවී ඇති බවත්, වගඋත්තරකාර මාණ්ඩලික සැරයන්වරයාට උසස්වීම් ලබාදී ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව පළමු ගැටළුව වන යුධ හමුදා රෝහලට ආසන්න කඳවුරක් ලබාදීම සම්බන්ධයෙන් යුධ හමුදාව විසින් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු 2017.09.29 වන දින සිට යුධ හමුදා රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමේ කටයුතු අවසන්වී ඇති බැවින් පැමිණිලිකරුට යුධ හමුදා රෝහල සඳහා පැමිණීමට අවශ්‍ය නොවන බැවින් ද, පැමිණිලිකරු වසර 11 ක් පනාගොඩ යුධ හමුදා කඳවුරේ සේවය කර ඇති බැවින් ද, අනුරාධපුර කඳවුර වෙත මාරු කළ බවත්, අනුරාධපුර යුධ හමුදා රෝහලෙන් අවශ්‍ය වන්නේ නම් ප්‍රතිකාර ලබාගත හැකි බවත්ය.

පැමිණිලිකරුගේ උස්වීම් අහිමිවීම සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු 2016.11.18 වන දින තාවකාලික වෛද්‍යවර්ගීකරණයට යටත් කර ඇති බැවින්, යුධ හමුදා නීතියට අනුව එම කාලය තුළ උසස්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බවයි. ඉන්පසුව නැවත උසස්වීම් ලබාදීම් සම්බන්ධයෙන් සලකා බලන මණ්ඩලය පැමිණිලිකරුට උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් සලකා බලා ඇති 2017.12.20 සිට ස්ථිර කෝප්‍රල් නිලයට උසස් කිරීමට වෛද්‍ය සේවා අධ්‍යක්ෂතුමා වෙත යොමු කර ඇති බවත්, ඉදිරියේදී ඒ සඳහා අනුමැතිය ලැබීමට නියමිත බවත්ය.

වගඋත්තරකරුට උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, ඔහුට යුධ හමුදා ලඝු නඩු විභාගයේදී ලබාදී ඇති දඬුවමට අනුව වසර දෙකක කාලයක් උසස්වීම් සඳහා බලපාන නමුත්, හමුදා නියෝග 7/2014 යටතේ දඬුවම් ලබාදුන් දින සිට වසරක කාලයක් හෝ

ඉන්පසුව ඔහුගේ ක්‍රියාකලාප යහපත් වන්නේ නම් උසස්වීම් වලට නිර්දේශ කළ හැකි බවයි. ඒ අනුව සැරයන් තිලයේ සිට බලයලත් නිලධාරි තනතුරට උසස්වීම් ලබදී ඇති බවයි.

මෙහිදී පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, තමාගේ ශ්‍රවන ආධාරක උපකරණය මේවනවිට ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා ප්‍රතිකාර ලබාගැනීමට නුගේගොඩ වික්‍රමාරච්චි ආයතනයට යාමට අවශ්‍ය බවද, ඒ අනුව එහි යැමට පහසු ස්ථානයක් ලබාදෙන ලෙසත්, තමා මුළතැන්ගෙයි රාජකාරි කරන බැවින් එහි පවතින රස්නය ශ්‍රවන ආධාරක උපකරණයට සුදුසු නොවන බැවින් ඒ සම්බන්ධයෙන් සලකා බලා සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙසත්ය.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු හට වගඋත්තරකාර මාණ්ඩලික සැරයන් දසනායක යන අය විසින් 2013.01.28 වන දින පෞද්ගලික හේතුවක් මත පහරදී ඇති බවත්, එහි ප්‍රතිපලයක් ලෙස කණ ආබාධිත වී ඇති බවත් නිරීක්ෂණය වේ.

මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු යුධ හමුදා පොලිසියට පැමිණිලි කිරීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර ඇත. ඒ අනුව වගඋත්තරකරුට විරුද්ධව යුධ හමුදා නීතියට අනුව දඩුවම් ලබාදී ඇත.

මෙම පහරදීම සම්බන්ධයෙන් වගඋත්තරකාර මාණ්ඩලික සැරයන් දසනායක යන අයගෙන් රු. 210,000/- ක මුදලක් පැමිණිලිකරු ලබාගෙන ඇත. පැමිණිලිකරු මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත්තේ සිද්ධිය වී වසරකට පසුව එනම්, 2014.01.20 දින බවද නිරීක්ෂණය වේ.

අවසන් පරීක්ෂණයේදී පැමිණිලිකරුට ප්‍රතිකාර ලබාගැනීම සඳහා පහසු ස්ථානයක් ලබාදෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත දැනුම්දීමෙන් පසුව පාතදුර ආසන්න කඳවුරකට ස්ථාන මාරුවක් ලබාදී ඇති බවට පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. එසේම අදාළ උසස්වීම් සම්බන්ධයෙන් ද කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකරුට පහරදී ඇත්තේ 2013.01.28 දින වන අතර, ඉන්පසුව ඒ සම්බන්ධයෙන් යුධ හමුදා පොලිසිය විසින් පරීක්ෂණයක් පවත්වා වගඋත්තරකරුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවට තහවුරු වන බැවින්ද, වගඋත්තරකරුගෙන් රු. 210,000/- ක මුදලක් පැමිණිලිකරු විසින් ලබාගෙන ඇති බැවින් ද, පැමිණිලිකරුට යුධ හමුදාව විසින් රාජකාරි

සඳහා පහසු ස්ථානයක් ලබාදී ඇති බැවින්ද, පැමිණිලිකරු මේවනවිට සහන ලබාගෙන ඇති බවට තහවුරු වේ.

**නිර්දේශය :-**

කෙසේ වෙතත්, යුධ හමුදාව තුළ සෙසු නිලයන්ට පහරදීම් සහ වධහිංසා වලට ලක් කිරීම සම්බන්ධයෙන් පැමිණිලි වාර්තා වන බැවින්, එම ක්‍රියාවන් නැවැත්වීමට පියවර සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට යුධ හමුදාපතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.06.30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A-Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/